# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සාධන පරීක්ෂණය

**3 ශ්‍රේණිය**

නම : .................................................. පාසල : ..................................................................

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්


★ **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. අපේ රටේ ජාතික ගීය නිර්මාණය කරන ලද්දේ,
 (i) ආනන්ද රාජකරුණා මහතා
 (ii) ආනන්ද සමරකෝන් මහතා
 (iii) ආනන්ද කුමාරස්වාමි මහතා

02. පාසලේදී පිළිපැදිය යුතු නීතියක් නොවන්නේ,
 (i) විශේෂ සන්නිවේදන වලට අවනත වීම.
 (ii) ජාතික ගීය ගායනයේදී සීරුවෙන් නොසිටීම.
 (iii) විවේක කාලයට අවනත වීම.

03. රාමසාන් උත්සවය පවත්වනු ලබන්නේ,
 (i) ඉස්ලාම් ආගමිකයින් (ii) හින්දු ආගමිකයින් (iii) බර්ගර් ජාතිකයින්

04. ආහාර ලබා දෙමින් මිනිසාට උදව් කරන්නේ,
 (i) කිකිළි (ii) ගැඩවිලා (iii) කපුටා

05. 
 ඉහත රූපයේ දැක්වෙන මැහුම් ක්‍රමය වන්නේ,
 (i) දම්වැල් මැස්ම
 (ii) පිස්මේන්තු මැස්ම
 (iii) බ්ලැන්කට් මැස්ම

06. 'රන් දැකැති ගෙන නිති සැරසෙනවා' යන කවිය,
 (i) පතල් කවියකි (ii) ගොයම් කවියකි (iii) නෙළුම් කවියකි

07. භාණ්ඩයක් මිලදී ගැනීමේදී වඩාත් සැලකිලිමත් විය යුත්තේ,
 (i) මිල ගැනය.
 (ii) කල් ඉකුත්වීමේ දිනය ගැනය
 (iii) නිෂ්පාදිත දිනය ගැනය

08. ස්වාභාවික අනතුරක් නොවන්නේ,
 (i) ගංවතුර (ii) රිය අනතුරු (iii) සුනාමි

09. යාපනය ප්‍රදේශයේ ජලය ලබා ගැනීම සඳහා බහුලව භාවිතා කරන ක්‍රමයක් වන්නේ,
 (i) පීල්ල (ii) ගංගා (iii) ආඩියා ළිඳ

10. ගෙවත්තේ බෝග ආරක්ෂා කර ගැනීම සඳහා වගා කරන පැළෑටි වර්ගයක් වන්නේ,
 (i) කෝමාරිකා (ii) දහස්පෙතියා (iii) උඩවැඩියා

(ලකුණු 20)

★ **පහත වැකි කියවා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

01. කොස්, උණ, දෙල්, සියඹලා යන ශාක පත්‍ර එකම හැඩයක් ගනී. ( )

02. සමනලයා, මී මැස්සා රෝග බෝ කරති. ( )

03. වී හුලං කිරීමට හා හාල් පෙළීමට කුල්ල භාවිතා කරයි. ( )

04. නාය යාම අවම කිරීම සඳහා කඳුකර ප්‍රදේශ වල ගස් සිටුවීම කළ යුතු දෙයකි. ( )

05. ආහාර ගැනීමේදී අන් අයගේ ආහාර පිඟානට අත දැමීම හොඳ පුරුද්දකි. ( )

06. දියවැඩියාව බෝ නොවන රෝගයකි. ( )

07. තමන් සමඟ සිටි අයෙකු දියට වැටුණහොත් උදව් ඉල්ලා කෑ ගැසීම හොඳ නැත. ( )

08. ජලය සීමිත සම්පතක් බැවින් අරපිරිමැස්මෙන් භාවිත කිරීම හොඳ පුරුද්දකි. ( )

09. පැණිබීම බෝතල් වල ලේබලයේ කොළපාට සලකුණු තිබේ නම් එය පානයට සුදුසුය. ( )

10. මාර්ගයේ පයින් ගමන් කරන විට මාර්ගයේ වම් පසින් ගමන් කළ යුතුය. ( )

(ලකුණු 10)

★ **හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. පාසලේ ඇති බිත්ති අපිරිසිදු කිරීම නිසා පාසලේ සුන්දරත්වයට ................................................................ (හානි වේ / හානි නොවේ)

02. සෑම වර්ෂයකම ................................................................ ශ්‍රී ලාංකිකයන් විසින් නිදහස් දිනය සමරනු ලබති. ( පෙබරවාරි 4 / පෙබරවාරි 14)

03. ක්‍රීඩා ක්ෂේත්‍රයේ සුවිශේෂ දක්ෂතා දැක් වූ කාන්තාවක් ලෙස ................................................................ හැඳින්විය හැකිය. (සිබිල් වෙත්තසිංහ මහත්මිය / සුසන්තිකා ජයසිංහ මහත්මිය)

04. ගස්වැල් වලින් ................................................................ ලබා දේ. (සිසිලස / දැඩි රස්නය)

05. අතීතයේදී ජලය පිරිසිදු කර ගැනීමට ................................................................ සිදු කරන ලදී. (ක්ලෝරීන් යෙදීම / ඉඟිනි ඇට දැමීම.

06. ................................................................ එකවර මිනිසුන් විශාල සංඛ්‍යාවක් ගෙන යා හැකි වාහනයකි. (දුම්රිය / ත්‍රී රෝද රථය)

(ලකුණු 06)

★ **ගැළපෙන පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 01. | ජාතික ගීය ගායනා කරන විට සිටිය යුත්තේ | ගොයම් |
| 02. | ඉස්ලාම් ආගමිකයින්ගේ ආගමික ස්ථානය | නත්තල් |
| 03. | සිහින් දිගටි පත්‍ර සහිත ශාකයකි. | සීරුවෙන් |
| 04. | කතෝලික ආගමික උත්සවයකි. | මස්ජිදය |
| 05. | පොදු ප්‍රවාහන සේවයකි. | සිදුරු විදිනය |
| 06. | කඩදාසියක සිදුරක් විදීමට යොදා ගනී. | ගවයා |
| 07. | ඖෂධ ලබා දෙන සතෙකි. | නාය යෑම |
| 08. | ගොවිතැන් කටයුතු වලට සහය ලබා දෙන සත්ත්වයෙකි | දුම්රිය |
| 09. | ස්වාභාවිකව සිදුවන අනතුරකි | දුගඳ හමයි. |
| 10. | ආහාර නරක් වූ විට | මී මැස්සා |

(ලකුණු 20)

★ **පිළිතුරු සපයන්න.**

01. ඔබට සතුටු හිතෙන අවස්ථා 2 ක් නම් කරන්න.

(i) ........................................................ (ii) ........................................................


02. හින්දු ආගමික උත්සව 2 ක් නම් කරන්න.


(i) ........................................................ (ii) ........................................................

03. ශාක වැඩීමට අවශ්‍ය සාධක 2 ක් නම් කරන්න.

(i) ........................................................ (ii) ........................................................

04. පහත දැක්වෙන සතුන්ගෙන් සිදුවන ප්‍රයෝජනය බැගින් ලියන්න.

(i) 

(ii) 

........................................................ ........................................................

05. රෝග බෝ කරන සතුන් දෙදෙනෙකු නම් කරන්න.

(i) ........................................................ (ii) ........................................................

(ලකුණු 20)

06. කවිය සම්පූර්ණ කරන්න

ඉර දෙවියන්ගේ ඉරගල ගාවා

..........................................................................

ගණ දෙවියන්ගේ කෝවිල ගාවා

.......................................................................... (ලකුණු 06)

07. වෙළඳපොලෙන් පැකට් කළ ආහාර පාන මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 2 ක් ලියන්න.

(i) ..................................................... (ii) .....................................................

08. ආහාර ගන්නා අවස්ථාවේදී අප විසින් පවත්වා ගත යුතු සිරිත් විරිත් 2 ක් ලියන්න.

(i) ..................................................... (ii) .....................................................

09. කෙනෙකුගෙන් තවත් කෙනෙකුට බෝ විය හැකි රෝග 2 ක් නම් කරන්න.

(i) ..................................................... (ii) .....................................................


10. භාණ්ඩ ප්‍රවාහනය කළ හැකි වාහන 2 ක් නම් කරන්න.

(i) ..................................................... (ii) .....................................................

11. ගෙවත්තක දක්නට ලැබෙන ප්‍රධාන අංග 2 ක් ලියන්න.

(i) ..................................................... (ii) .....................................................


10. පහත උපකරණවලින් ගන්නා ප්‍රයෝජනය බැගින් ලියන්න.

(i) 

(ii) 

..................................................... ..................................................... (ලකුණු 12)

★ **පහත දැක්වෙන ගසෙහි කොටස් වරහන තුළින් තෝරා නම් කරන්න.**




(මුදුන් මුල / පැති මුල් / කඳ / පත්‍ර (කොළ) / ගෙඩි (ඵල) / මල් (පුෂ්ප)

(ලකුණු 6)